Department of Education, Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ගිණුම්කරණය

සතිය - 13

ශ්‍රේණිය - 12

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

නිපුණතාව 4.0 - මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.

නිපුණතා මට්ටම 4.5 - වෙළෙඳ භාණ්ඩ ණයට ගැනීම සම්බන්ධ තොරතුරු පවත්වා ගනියි.

1.තරිඳු ව්‍යාපාරය නැවත විකිණීම සඳහා අත් ඔරලෝසු 20ක් මිළදී ගැනීමට 2020/03/02 දින මූර්ති ව්‍යාපාරයට ඇණවුමක් යැවූ අතර 2020/03/10 දින අත් ඔරලෝසුවක් රු.1,200ක් බැගින් මිල සඳහන් කර,තරිඳු ව්‍යාපාරය වෙත ඔරලෝසු 20ක් එවීය.ඉල්ලුම් කළ වර්ගයට වඩා වෙනස් වීම මත ඔරලෝසු 10ක් 2020/03/20 වෙනි දින මූර්ති ව්‍යාපාරය වෙත ආපසු යැවීය.

ඉහත සිද්ධියට අනුව තරිඳු ව්‍යාපාරයේ ගනුදෙනු සටහන් කරන මූලික සටහන් පොත් හා ඊට අදාළ මූලාශ්‍ර ලේඛන පහත වගුවේ සඳහන් කරන්න.

| ගනුදෙනුව | අදාළ මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛන |
|---|---|---|
| | | |
| | | |

2.ණයට ගත් වෙළෙඳ භාණ්ඩ සැපයුම්කරුවන් වෙත ආපසු යැවීමට හේතු මොනවාද?

3.VAT ලියාපදිංචි නොවූ ආයතනයක ආපසු යැවුම් ජර්නලයේ එකතුව පොදු ලෙජරයේ වාර්තා කරන ආකාරය කුමක්ද?

1.ගැනුම් ගිණුමට හා ණයහිමි ගිණුමට බැර කරයි.
2.ණයහිමි ගිණුමෙහි හා ආපසු යැවුම් ගිණුමෙහි හර කරයි.
3.ආපසු යැවුම් ගිණුමෙහි හා ණයහිමි පාලන ගිණුමෙහි බැර කරයි.
4.ණයහිමි පාලන ගිණුමෙහි හර කර ආපසු යැවුම් ගිණුමට බැර කරයි.
5.ආපසු යැවුම් ගිණුමෙහි පමණක් බැර කරයි.

4.පහත ප්‍රකාශ සත්‍යද,අසත්‍යද යන්න දක්වන්න.

1.ගැනුම් ජ'නලය පිළියෙල කිරීමෙන් පසු වෙළෙඳ වට්ටම් ගිණුම්ගත කෙරේ. (..............)
2.ඒ ඒ හරපතේ ශුද්ධ වටිනාකම අදාළ ණයහිමි ගිණුම්වලට හර කෙරේ. (...................)